# ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය

## තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයේ පුරප්පාඩුව් ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

### 01. පරිපාලක (කොන්ත්‍රාත් පදනම මත) පිරිමි

*I.* **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයක රාජ්‍ය/ව්‍යාපාර පරිපාලනය හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධිධාරියෙක් වීම සහ පිළිගත් විශ්වවිද්‍යාලයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් හා පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.
- මානව සම්පත් කළමනාකරණ වරලත් ආයතනයේ (IPM) හෝ ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ (IMSL) සාමාජිකත්වය හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

*II.* **සේවා පළපුරුද්ද**

- සේවක පරිපාලනය හා විනය ක්‍රියාපටිපාටි, කම්කරු අණපනත්, කම්කරු ආරවුල් ඇතුළුව කම්කරු නීති පිළිබඳ දැනුම, ගොඩනැගිලි නඩත්තුව, වාහන නඩත්තුව, ආරක්ෂක, පිරිසිදු කිරීම් සහ කාර්යාල කළමනාකරණ කටයුතු පිළිබඳ පළපුරුද්ද සහිතව රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ පරිපාලන සේවයේ වසර 15 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.
- මෙම තනතුර කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගනු ලබන අතර, වයස අවුරුදු 60 ඉක්මවිය යුතු අතර, 65 නොඉක්මවිය යුතුය.
- රාජ්‍ය අංශයේ සිට මෑතකදී විශ්‍රාම ගත්තා ලද නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම කෙරෙහි ද සලකා බලනු ලැබේ.

### 02. ගණකාධිකාරී (කොන්ත්‍රාත් පදනම මත)

*I.* **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

- ගිණුම්කරණය, වාණිජ, මුදල් පාලනය පිළිබඳ විශේෂ උපාධියක් හදාරා තිබීම හා CIMA, CMA, HNDA, ACCA, ICASL, IBSL සුදුසුකම් ලබා තිබීම.

*II.* **සේවා පළපුරුද්ද**

- ගණකාධිකාරීවරයෙකු වශයෙන් රජයේ හෝ පෞද්ගලික අංශයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද හා ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳව පරිගණක දැනුම (Quick Book මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම)
- මෙම තනතුරට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගනු ලබන අතර, වයස අවුරුදු 60 ඉක්මවිය යුතු අතර, 65 නොඉක්මවිය යුතුය.
- රාජ්‍ය අංශයේ සිට මෑතකදී විශ්‍රාම ගත්තා ලද නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම කෙරෙහි ද සලකා බලනු ලැබේ.

**සැලකිය යුතුයි :**

- පුද්ගලිකව සකස් කළ විස්තරාත්මක අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ සම්බන්ධතා විස්තර ද සහිතව 2022 දෙසැම්බර් මස 12 වැනිදා හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුරේ නම සඳහන් කරන්න.
- මෙම තනතුරුවලට අදාළ වැටුප් පිළිබඳව සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී එකඟතාවයට පැමිණිය හැකිය.

**ගරු ප්‍රධාන ලේකම්,**
**ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය,**
**විද්‍යා මාවත,**
**කොළඹ 07.**